**වීරකැටිය ප්‍රාදේශීය සභාව**
**හම්බන්තොට දිස්ත්‍රික්කය**
**-------------------------**

## 1 මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මැයි 11 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 අගෝස්තු 31 දින සභාපතිවරයාට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ **1.3** ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට වීරකැටිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය අවසන් දිනට කර්මාන්ත ණයහිමියෝ රු. 5,618,400 ක් හා කර්මාන්ත ණයගැතියෝ රු. 2,900,654 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ ඉදිකිරීම් කාර්යයන් පහක් වෙනුවෙන් දරා තිබූ එකතුව රු. 477,030 ක් වූ වියදම් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඇ) රු. 149,749 ක් වූ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මස උසාවි දඩ ආදායම ගිණුම්ගත කර නොතිබුණු අතර, පෙබරවාරි මස උසාවි දඩ ආදායම රු. 57,500 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඈ) ඉකුත් වර්ෂයේදී නිම කළ කර්මාන්තයක් වෙනුවෙන් ලැබී තිබුණු රු. 97,092 ක මුදල සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

**1.3.2 නොසැසඳුණු ගිණුම්**

මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ගිණුම් විෂයයන් 08 ක ශේෂයන් සහ ඊට අදාළ පොත්පත් හා උපලේඛනවල දැක්වෙන ශේෂයන් අතර නිරීක්ෂණය වූ අසමානතාවල එකතුව රු. 1,968,989 ක් විය.

**1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

(අ) ලැබිය යුතු ගිණුම්

i. 2007 වර්ෂයට අදාළව නඩු පවරා තිබුණු රු. 822,420 ක් වූ පොළ බදු මුදල් සහ 2013 හා 2014 වර්ෂයන්ට අදාළව යන්ත්‍රෝපකරණ කුලියට දීම මත නාගරික සංවර්ධන අධිකාරියෙන් අයවිය යුතු රු. 906,430 ක මුදල අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

ii. සභාව සතු යන්ත්‍රෝපකරණ කුලියට දීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසන් වන විට රු. 1,156,080 ක් හිඟව පැවති අතර, ඉන් රු. 906,430 ක් 2013 හා 2014 වර්ෂවලට අදාළව අයවිය යුතුව පැවතුණි.

(ආ) ගෙවිය යුතු ගිණුම්

දිගින් දිගටම මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙනෙමින් පවතින රු. 120,099 ක් වූ ගෙවිය යුතු වැටුප් හා සේවා නියුක්තියන්ගේ භාර අරමුදලට ගෙවිය යුතු රු. 41,893 ක් නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි.

**1.3.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොමැතිවීම**

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 258,150 ක් වූ ගිණුම් විෂයයන් 03 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

**1.3.5 නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම (රු.) | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 177 | 352,500 | තොරතුරු කළමනාකරණ පද්ධතියක් මිලට ගැනීමේදී ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කර නොතිබුණි. |

| | |
|---|---|
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | |
| i. මුදල් රෙගුලාසි 103 හා 104 | 2017 සැප්තැම්බර් මාසයේදී සිදු වූ කැබ් රථයේ අනතුර සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| ii. මුදල් රෙගුලාසි 1645 | එක් එක් මාසය වෙනුවෙන් 267 වන ආකෘතියේ ලොග් සටහන් පොත් විධිමත්ව යාවත්කාලීන කර නොතිබුණි. |
| (ඇ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සභාව සතු වාහන 08 ක ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි. |

**2. මූල්‍ය සමාලෝචනය**

---------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.10,040,908 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.10,773,593 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| i වරිපනම් හා අක්කර බදු | 2,590,500 | 3,362,197 | 3,864,936 | 4,447,880 | 2,552,740 | 2,545,846 | 2,218,419 | 4,897,419 |
| ii කුලී | 19,033,400 | 15,663,003 | 14,672,993 | 2,556,651 | 17,475,600 | 15,182,347 | 13,062,501 | 2,392,141 |
| iii බලපත්‍ර ගාස්තු | 1,972,900 | 2,241,553 | 2,269,794 | 96,158 | 1,948,500 | 1,789,480 | 1,789,852 | 95,000 |
| iv වෙනත් ආදායම් | 15,557,500 | 11,940,798 | 4,947,136 | 19,654,715 | 17,263,630 | 8,890,273 | 4,146,079 | 4,682,768 |
| එකතුව | 39,154,300 | 33,207,551 | 25,754,859 | 26,755,404 | 39,240,470 | 28,407,946 | 21,216,851 | 12,067,328 |

## 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

---------------------------------

සමාලෝචිත වර්ෂයට බිල්කළ මුළු ආදායම රු. 33,207,551 ක් වූ අතර, වර්ෂය තුළ රු.25,754,859 ක් රැස්කර තිබුණි. ඉකුත් වර්ෂය අවසානයට රු.12,067,328 ක් ව පැවති හිඟ ආදායම සමාලෝචිත වර්ෂය අවසානයට රු. 26,755,404 ක් දක්වා වර්ධනය වී තිබුණි.

## 2.2.3 වරිපනම්

---------

සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ වරිපනම් බදු ශේෂය රු. 4,424,310 ක් වූ අතර, ඊට ඇතුළත් රු. 5,000 කට වැඩි ශේෂ සහිත බදු ඒකක 146 කින් රු. 1,359,327 ක් අයවිය යුතුව පැවතුණි. හිඟ වරිපනම් බදු අයකර ගැනීම සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 (1)(අ) වගන්තියට අනුකූලව කටයුතු කර නොතිබුණි.

## 2.2.4 කඩ කුලී

--------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) වීරකැටිය හා වලස්මුල්ල පොදු වෙළඳ පොළ කඩ කාමර 06 ක් බදු දී ආදායම් උපයා ගැනීමට 2017 වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණු අතර, එම කඩ කාමර පිළිවෙලින් 2011 සහ 2016 වර්ෂවල සිට නිෂ්කාර්යව පැවතුණි.

(ආ) වලස්මුල්ල පොදු වෙළඳපොල අංක 02 හා 07 කඩ කාමර 2011 වර්ෂයේදී ටෙන්ඩර් කර බදුකරුවකු වෙත ලබාදී තිබුණද, එම වර්ෂයේ සිට 2017 දෙසැම්බර් 27 දින දක්වාම කිසිදු කුලී මුදලක් අය නොවීම නිසා සභා අරමුදලට රු. 324,000 ක් අහිමි වී තිබුණි.

(ඇ) පොදු වෙළඳපොල කඩ කාමර අංක 10 දීර්ඝ කාලයක සිට බිල් කිරීම් සිදුකර නොතිබුණි. එකී කාලයට අදාළව රු. 2,500 බැගින් වූ මාසික තක්සේරු කුලිය සභාවට අහිමිවී තිබුණි.

(ඈ) දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ අංක දපපා/පපාකො/2010/01 හා 2010 දෙසැම්බර් 27 දිනැති චක්‍රලේඛයේ 06 වන ඡේදය අනුව වසර 05 කට වරක් තක්සේරු ගත බදු මුදල නව තක්සේරුවක් මගින් සංශෝධනය කළ යුතු වුවත්, වීරකැටිය පස්මංහන්දිය කඩ කාමර 04 ක් හා වලස්මුල්ල පොදු වෙළඳපොල කඩ කාමර 10 ක් පිළිවෙලින් 2006 හා 2011 වර්ෂවල දී අවසන් වරට තක්සේරු කර තිබුණි.

(ඉ) වලස්මුල්ල සුපිරි වෙළඳසැල කඩ කාමර 42 සඳහා 2017 සැප්තැම්බර් 18 දිනැති තක්සේරු වාර්තා අනුව කුලී අය නොකිරීම නිසා 2017 ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා කාල පරිච්ඡේදයට අදාළව රු. 383,550 ක මුදලක් සභා අරමුදලට අහිමි වී තිබුණි.

(ඊ) (ඈ) හි සඳහන් චක්‍රලේඛයේ 05 ඡේදය අනුව සෑම ගිවිසුමක්ම වසර 03 කට වරක් යාවත්කාලීන කළ යුතු වුවත්, වීරකැටිය පස්මංහන්දිය කඩ කාමර 04 ක් හා වලස්මුල්ල බල ප්‍රදේශයේ කඩ කාමර 59 ක් සම්බන්ධයෙන් ගිවිසුම් යාවත්කාලීන කර නොතිබුණි.

### 2.2.5 ව්‍යාපාර බදු හා වෙළඳ බලපත්‍ර ගාස්තු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149, 150 හා 152 වගන්ති වල සඳහන් විධිවිධාන වලට අනුකූලව කටයුතු නොකිරීම නිසා සමාලෝචිත වර්ෂය අවසානයට ව්‍යාපාර බදු හා වෙළඳ බලපත්‍ර ගාස්තු වශයෙන් පිළිවෙළින් රු. 40,800 ක් සහ  රු. 11,625 ක් අයවිය යුතුව පැවතුණි.

### 2.2.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.3,136,770 ක් හා මුද්දර ගාස්තු රු.16,517,945 ක් විය. ඉන් රු. 2,814,574 ක උසාවි දඩ හා රු. 2,185,426 ක මුද්දර ගාස්තු 2018 මැයි මාසයේදී ලැබී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) ඉටු නොකළ කර්තව්‍යන්

සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය මගින් සහා අරමුදල් යටතේ ඉටු කිරීමට යෝජිතව තිබූ රු. 5,500,000 ක් වූ සංවර්ධන යෝජනා 11 ක් ඉටු කර නොතිබුණි.

(ආ) කර්තව්‍යන් ඉටු කිරීමේ ප්‍රමාදයන්

කර්මාන්ත 03 ක් ඉටු කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුළදී රු. 350,000 ක මුදලක් ලැබී තිබුණද, එම කර්මාන්ත ඉටු කිරීම සඳහා ගිවිසුම්ගත වීමට හෝ සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුළින් සහා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

---

සභා බල ප්‍රදේශය තුළ ස්ථාපනය කර ඇති වීථි පහන් සම්බන්ධයෙන් විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ 2010 අගෝස්තු 17 දිනැති අංක පීඊ/01/01 දරන චක්‍රලේඛයේ සඳහන් විධිවිධානවලට අනුකූලව, ලංකා විදුලිබල මණ්ඩලය මගින් අනුමත කර නොගැනීම නිසා සභා අරමුදලින් නඩත්තු කරන වීථි පහන් 3032 න් 656 ක් සඳහා පමණක් ගාස්තු ප්‍රතිපූර්ණය කර තිබුණි.

**3.3 මානව සම්පත් කළමනාකරණය**

---

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලයේ තනතුරු 07 කට අදාළව 13 දෙනෙකුගේ අතිරික්තයක් සහ තනතුරු 08 කට අදාළව 16 දෙනෙකුගේ පුරප්පාඩු පැවතුණි.

(ආ) සේවය හැරගිය හා වැඩ තහනමට ලක් වූ නිලධාරීන් 12 දෙනෙකුගෙන් අය විය යුතු එකතුව රු. 237,066 ක ණය ශේෂ අය කර ගැනීමට 2018 ජූනි 07 දින දක්වාම කටයුතු කර නොතිබුණි.

**3.4 වත්කම් කළමනාකරණය**

---

**3.4.1 වත්කම් ලේඛනගත නොකිරීම**

---

සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි 12 ක තොරතුරු ස්ථාවර වත්කම් ලේඛනයෙහි ඇතුළත් කර නොතිබුණි.

**3.4.2 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම**

---

2016 වර්ෂයේ ඉඩම් හා ගොඩනැගිලි සමීක්ෂණ වාර්තාවෙන් සභා දේපලවල ආරක්ෂාව සම්බන්ධයෙන් ඉඩම්වල වැට මායිම් හා ආරක්ෂිත වැටවල් යෙදීම, ඉඩම් වල රැඳී සිටින අනවසර පදිංචිකරුවන් හා වගාවන් සම්බන්ධව ක්‍රියාමාර්ග ගැනීම ආදිය නිර්දේශ කර තිබුණ ද ඒවා ක්‍රියාත්මක කර නොතිබුණි.

**3.4.3 නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්**

---

ණය අරමුදල් උපයෝගී කරගෙන රු. 6,645,000 ක පිරිවැයකට මිලදී ගෙන තිබුණු මාර්ග තලන යන්ත්‍රය 2012 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම නිෂ්කාර්යව පැවතුණි.

**3.4.4 පවරා නොගත් වත්කම්**

---

සභාව විසින් භාවිතයට ගනු ලබන හා නඩත්තු කරනු ලබන ඉඩම් හා ගොඩනැගිලි 34 ක සහ වාහන 08 ක නීත්‍යානුකූල අයිතිය සභාව වෙත පවරා ගෙන නොතිබුණි.

**3.4.5 හඳුනා නොගත් වත්කම්**

------------------------

ඉකුත් වර්ෂයට අදාළව සිදු කළ ස්ථාවර වත්කම් සමීක්ෂණයේදී හඳුනාගෙන නොතිබුණු ඉඩම් 07 ක භූමි ප්‍රමාණය අක්කර 07 ක් විය.

**3.4.6 වාහන උපයෝජනය**

---------------------

සභාව සතු වාහන 06 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා ආදායම් බලපත්‍ර ලබා ගෙන නොතිබුණි.

**3.5 ප්‍රසම්පාදන සැලැස්ම**

----------------------

සමාලෝචිත වර්ෂය සඳහා සභාව විසින් ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

**4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය**

------------------------------------

**4.1 අයවැය පාලනය**

-------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැයගත සහ තථ්‍ය ආදායම් හා වියදම් අතර පහත දැක්වෙන පරිදි සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන්, අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණ බව නිරීක්ෂණය විය.

(අ) වියදම් විෂයයන් අටක ඉතිරිකිරීම් වල එකතුව රු. 18,761,006 ක් වූ අතර, එම වටිනාකම් සියයට 10 සිට 43 දක්වා අගය පරාසයක විය.

(ආ) ආදායම් විෂයයන් තුනක අහිතකර විචලනය රු. 12,175,218 ක් වූ අතර, එම වටිනාකම් සියයට 18 සිට 53 දක්වා පරාසයක විය.

(ඇ) ආදායම් විෂයයන් තුනක ඇස්තමේන්තුගත ආදායම ඉක්මවා රු. 2,546,292 ක් උපයා ගෙන තිබූ අතර, එම වටිනාකම් සියයට 14 සිට 83 දක්වා පරාසයක විය.

**4.2 විගණන හා කළමනාකරණ කමිටු**

-------------------------------------

2009 ජුනි 09 දිනැති අංක DMA/2009 (1) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව කාර්තුවකට 01 බැගින් වාර්ෂිකව විගණන හා කළමනාකරණ කමිටු 04 ක් පැවැත්විය යුතු වුවත්, සමාලෝචිත වර්ෂය සඳහා කමිටු රැස්වීම් 03 ක් පමණක් පවත්වා තිබුණි.

**5. පද්ධති හා පාලන**

--------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින් වර සභාවේ අවධානයට යොමු කර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| පද්ධතිය | අඩුපාඩුව |
| --- | --- |
| (අ) ගිණුම්කරණය | i. ගිණුම් ශේෂ අත්හැරීම්, අඩුවෙන් හා වැඩියෙන් දක්වන ලද අවස්ථා පැවතීම. |
| | ii. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වටිනාකම් හා උපයෝගී ලේඛනවල දැක්වුණු වටිනාකම් අතර වෙනස්කම් පැවතීම. |
| (ආ) ආදායම් පරිපාලනය | i. හිඟ ආදායම් අය කිරීම ප්‍රමාද වීම. |
| | ii. නව ආදායම් උත්පාදන මාර්ග හඳුනා නොගැනීම. |
| | iii. නව තක්සේරු වාර්තා අනුව කඩ කාමර කුලී අය නොකිරීම. |
| (ඇ) වත්කම් පාලනය | i. ඉඩම්, ගොඩනැගිලි හා වාහනවල අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබීම. |
| | ii. වාහනවල ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබීම. |
| (ඈ) අයවැය පාලනය | i. අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම් විෂයයන් අතර සැලකිය යුතු විචලනයන් උද්ගත වී තිබීම. |
| | ii. අයවැයගත ඉලක්ක සම්පූර්ණ කර ගැනීම සඳහා කටයුතු කර නොතිබීම. |